# සාමාන්‍ය සමයේ තිස් දෙවන ඉරුදින

## පළමුවන දේව ප්‍රකාශනය ප්‍රඥා 6: 12–16

*සලමොන්ගේ ප්‍රඥාව නම් පොතෙන් උපුටා ගත් කොටසකි.*

ප්‍රඥාව සොයන්නාට එය සම්භ වේ.

ප්‍රඥාව දීප්තිමත් ය. ඇය මලානික නොවේ. ඇයට ප්‍රේම කරන අයට ඇය හොඳින් පෙනේ. ඇය සොයන අය ඇය ලබා ගනු ඇත. තමාට ආශා කරන අය ගැන ඇය කලින් දැනගෙන ඔවුන්ට ප්‍රකාශ වනු ඇත. ඇය එන තෙක් වේලාසනින් බලා සිටින්න. ඔබට කරදරයක් නොවනු ඇත. ඔබේ දොරටු ළඟ ඇය සිටිනු ඔබට හමු වේ. ඇය ගැන සිතීම පවා අංග සම්පූර්ණ දැනීමක් ලැබීම ය. ඇය ගැන පරික්ෂාකාරී ව සිටින්න. එවිට, විගස, කරදර ඔබෙන් දුරුවනු ඇත. ඇය ලබාගැනීමට සුදුසු අය සොයමින් ඇය සැරිසරනු ඇත. ඔවුන්ගේ මාර්ගවල දී විනීත ලෙස මුණගැසී ඔවුන්ගේ සිත්සතන් තුළ ප්‍රකාශ වනු ඇත.

*දේව වචනය මෙසේ ය.*

## පිළිතුරු ගීය ගීතාවලිය 63: 1–7

පිළිතුර: සමිඳුනි, මාගේ දෙවිඳුනි, මාගේ ආත්මය
ඔබ කෙරෙහි පිපාසයෙන් පෙළෙන්නේ ය.

ගීය : දෙවිඳුනි, මාගේ දෙවිඳුනි, දැඩි ආශාවෙන් මම ඔබ සොයන්නෙමි.
මා හද ඉතා ගිජු ලෙස ඔබ කෙරෙහි පිපාසයෙන් පෙළෙන්නේ ය.
වියළි බිම ජලයට පිපාසා වන පරිදි
මම ඉතා ආශාවෙන් ඔබ වෙත ඇදී යන්නෙමි.

ඔබේ ශුද්ධස්ථානයේ දී මම ඔබ දෙස ඕනෑකමින් බලා සිටින්නෙමි.
ඔබේ බලය ද මහිමාලංකාරය ද නරඹන්නෙමි.
ඔබේ තිර පෙම මගේ ජීවිතයටත් වඩා මට අගනේ ය:
මාගේ මුව ඔබට ප්‍රශංසා කරන්නේ ය.

මුළු ජීවිතයේ දී ම මම ඔබට ප්‍රශංසා කරන්නෙමි:
ඔබේ නාමයෙන් අයැදිමින් මම ඔබ දෙසට දෑත නගන්නෙමි.
රස මස'වුලින් මෙන් මම සෑහීමට පත් වන්නෙමි:
මා මුවින් තුති ගී ගයා මම ඔබ පසසන්නෙමි.

යහනේදීත් මම ඔබ ගැන සිතන්නෙමි:
රෑ යාමවල දී ඔබ ගැන මෙනෙහි කරන්නෙමි.
මන්ද, ඔබ වහන්සේ මාගේ ආධාරය වූ සේක.
ඔබේ පියාපත් සෙවණෙහි මම ප්‍රීති වන්නෙමි.

## දෙවන දේව ප්‍රකාශනය 1 තෙසලෝනික 4:13–18 හෝ 4:15–18

*ශුද්ධ වූ පාවුලු තුමන් විසින් තෙසලෝනිකවරුන්ට ලියන ලද පළමුවන හසුනෙන් උපුටා ගත් කොටසකි.*

### ස්වාමින් වහන්සේ තුළ පරලෝ සැපත් වූ අය දෙවියන් වහන්සේ නැවත ගෙනෙන සේක.

සහෝදරවරුනි, මතු බලාපොරොත්තුවක් නැති සෙසු අය මෙන් ඔබ ශෝක නොවන පිණිස, මියගියවුන් ගැන ඔබ නොදැන සිටීම කිසිසේත් අපගේ කැමැත්ත නොවේ. ජේසුස් වහන්සේ නැසී නැවත උත්ථාන වූ සේකැ යි අපි අදහමු: එසේ ම, ජේසුස් වහන්සේ කෙරෙහි විශ්වාස කරමින් උන් වහන්සේ තුළ සැතපුණු අය, උන් වහන්සේ මගින් දෙවියන් වහන්සේ නැවත ගෙනෙන සේකැ යි ද අදහමු.

(අප දැන් ඔබට කියන්නේ සමිඳාණන් වහන්සේ ම වදාළ කරුණකි. එනම්: සමිඳාණන් වහන්සේගේ ආගමනයේ දී ජීවත් ව සිටින අපට, උන් වහන්සේ තුළ සැතපුණු අයට නොමැති විශේෂ වාසියක් නැති බව ය. මන්ද, සමිඳාණන් වහන්සේ ම අණ දීමේ ශබ්දය ද, අග්‍ර දේව දූතයෙකුගේ හඬ ද, දෙවියන් වහන්සේගේ හොරණෑ නාදය ද ඇතිව ස්වර්ගයෙන් බැස වදාරන සේක. ක්‍රිස්තුන් වහන්සේ අදහමින් උන් වහන්සේ තුළ සැතපුණු අය පළමුකොට නැගිටින්නෝ ය. එවිට ජීවතුන් අතර සිටින අපි, ඔවුන් සමඟ සමිඳාණන් වහන්සේ හමු වන පිණිස, වලාකුළුවලින් අහසට ඔසවා ගනු ලබන්නෙමු. මෙසේ අපි නිතර ම සමිඳාණන් වහන්සේ සමඟ සිටින්නෙමු. එහෙයින් මේ වචනවලින් එකිනෙකා සනසන්න.)

*දේව වචනය මෙසේ ය.*

*(වරහන් අතර කොටස අත් හළ හැකි ය.)*

## සුපුවත් ජය නද | මතෙව් 24: 42, 44

ආලේලූයා! ආලේලූයා!
අවදි ව ඉන්න, සූදානම් ව සිටින්න.
කුමක් නිසාද, ඔබ බලාපොරොත්තු නොවන පැයක දී
මනුෂ්‍ය-පුත්‍රයාණෝ වඩින සේක.
ආලේලූයා!

## සුවිශේෂය | මතෙව් 25: 1-13

*සුවිශේෂක මතෙව් තුමාගේ ශුද්ධ වූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.*

### අන්න, මනාලයා! ඔහු පෙරමගට යන්න.

“ස්වර්ග රාජ්‍යය මෙසේ උපමා කළ හැකි ය. තෙල් පහන් රැගෙන මනාලයා පෙරමගට යුවතියෝ දස දෙනෙක් ගියෝ ය. ඔවුන් අතරෙන් පස් දෙනෙක් නුවණ නැති අය ය: පස් දෙනෙක් නුවණ ඇති අය ය. නුවණ නැති අය සිය පහන් ගෙන යද්දී ඒ සමග තෙල් ගෙන ගියේ නැත. එහෙත්, නුවණ ඇති අය සිය පහන් ගෙන යද්දී ඒ සමග බඳුන්හි තෙල් ගෙන ගියහ. මනාලයාගේ පැමිණීම පමා වූ කල ඒ සියල්ලෝ ම නිදිබර වී නිදා ගත්හ.

මධ්‍යම රාත්‍රියේ දී ‘අන්න, මනාලයා! ඔහු පෙරමගට යන්නැ’ යි හඬක් විය. එවිට ඒ සියලු යුවතියෝ නැගිට සිය පහන්වල තිර සකස් කළහ. එකල නුවණ නැති අය, ‘අපේ පහන් නිවීගෙන යයි, ඔබගේ තෙල්වලින් ටිකක් අපට දෙන්නැ’ යි නුවණ ඇති අයට කී හ. එහෙත් නුවණ ඇති අය, ‘එසේ කළ නොහැක: අප දෙගොල්ලන්ට ම සෑහෙන තරම් තෙල් මෙහි නැත. එබැවින් වෙළඳුන් වෙත ගොස් ඔබ ම මිල දී තෙල් ගන්නැ’ යි පිළිතුරු දුන්හ. ඔවුන් ගිය පසු මනාලයා ආවේ ය: සූදානම් ව සිටි පස් දෙනා ඔහු හා සමග මංගලෝත්සවයට ගියහ. ඔවුන් ඇතුල් වූ විට දොර වසන ලදි.

පසුව අනෙක් යුවතියෝ අවුත්, ‘ස්වාමිනි, ස්වාමිනි, අපට දොර ඇරිය මැනවැ’යි කී හ. එහෙත් මනාලයා, ‘මම ඔබ කිසිසේත් නොහඳුනමි’යි පිළිතුරු දුන්නේ ය. එබැවින් දවස වත් පැය වත් ඔබ නොදන්න නිසා අවදි ව ඉන්නැ” යි ස්වාමින් වහන්සේ වදාළ සේක.

*සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.*